**නාවික සංවර්ධන අරමුදල - 2018**
**-------------------------------------------**

## 1.1 මතය ව්‍යාචනය

**--------------------**

නාවික සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කාර්යසාධන ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කාර්යසාධන ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2. මතය ව්‍යාචනය සඳහා පදනම

**------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්ර්කාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
---------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාර බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාර බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රමිත අංක 1 හි ඡේද 38 අනුව අස්ථිත්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවත්නා බව කළමනාකරණය දන්නා විටෙක එම අවිනිශ්චිතතාවන් පිළිබඳව හෙළිදරව් කළ යුතු වුවත් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව පවත්නා අවිනිශ්චිතතාවන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | 2018 අගෝස්තු 18 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට කටයුතු කරමින් පවතී. | අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව පවත්නා අවිනිශ්චිතතාවයන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කල යුතු වීම. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනාධිපති කාර්යාලයට අරමුදලින් ලබාදී තිබූ රු. 366,691,764 ක මුදල් සම්බන්ධව කිසිදු සනාථ කිරීමේ ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ලබාදී තිබූ රු.55,000,000 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබාගත් බැවින් එය සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වගකීමක් නොවන බවත් විගණනය වෙත වාර්තාකර තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස පෙන්නුම් කෙරෙන සමස්ථ වටිනාකම වූ රු. 421,691,764 ක් සඳහා ශේෂ සනාථකිරීම් නොලැබීම හා අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස නොදැක්වීම මත මුදල් අයවීම අවිනිශ්චිතව පැවතුණි. | 2018 අගෝස්තු 18 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට කටයුතු කරමින් පවතී. | අදාල අනුමැතියන් ලබාගෙන2/2018 චක්‍රලේඛය ප්‍රකාර අරමුදල වසා දැමීමට කටයුතු කල යුතු වීම. |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1. අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත යටතේ නැව් නියෝජිතයන් ගෙන් අයකළ ගාස්තු හා කොමිස් මුදල් උපයෝගීකර ගනිමින් අරමුදල පිහිටුවා තිබුණු අතර ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ලෙස වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන ගොස් තිබුණි. 2011 මැයි 24 දිනැති අංක පීඊ/සීඕපී/(4)31ජීඊඑන් දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියේ උපදෙස් පරිදි අරමුදලෙන් රු.මිලියන 46.47ක් නව මගී පර්යන්තයක් පිහිටුවීම සඳහා ආයෝජනය කිරීමට සී.ස. ලංකා නැව් සංස්ථාවට මුදාහැර ඉතිරි මූල්‍යමය වත්කම් උපලබ්ධිකර 2012 සැප්තැම්බර් 10 දින වනවිට ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. එදිනෙන් පසු කිසිදු මෙහෙයුම් කටයුත්තක් රහිතව අරමුදල අක්‍රියව පැවති බැවින් අරමුදලේ අඛණ්ඩ පැවැත්මක් නොතිබුණි | 2018 අගෝස්තු 18 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට කටයුතු කරමින් පවතී. | අරමුදල අක්‍රීය බැවින් නියමිත පරිදි අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු වීම. |

**2.2. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අයවැය යෝජනා අනුව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන භාණ්ඩාගාර කමිටුවේ නිර්දේශ හා ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශ මත 2017 අගෝස්තු 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අරමුදල වසා දැමීමට අනුමැතිය ලබාදී තිබුණි.<br><br>ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් 2018 අගෝස්තු 18 දින නිකුත් කර තිබුණු අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් අරමුදල වසා දැමීමට කඩිනම් පියවර ගන්නා ලෙස උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත් 2019 මාර්තු 31 දින වන විටත් අරමුදල වසා දැමීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | 2018 අගෝස්තු 18 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට කටයුතු කරමින් පවතී. | අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි අරමුදල වසා දැමීමට කඩිනම් පියවර ගත යුතු වීම. |